1995-10-0 9


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 849/7 — 1994 දෙසැම්බර් 13 වැනි අඟහරුවාදා — 1994.12.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත

32 (2) වන වගන්තිය යටතේ නිවේදනය

1992 අංක 51 දරන පනතින් සංශෝධිත 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ 32(2) වන වගන්තිය [යටතේ සමුපකාර පළාත් සභා සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් එකී පනතේ 32(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සාදනු ලැබ මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලබන නියෝග අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේකම්,
සමුපකාර පළාත් සභා සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

1994 නොවැම්බර් මස 29 වැනි දින
කොළඹ දී ය.

### උපලේඛනය

සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සාදනු ලැබ 1981 දෙසැම්බර් 1 වන දින අංක 169/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 1982 නොවැම්බර් 11 වන දින අංක 218/12 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සමුපකාර සේවක කොමිෂන් සභා (සාමාන්‍ය) නියෝග මෙයින් පහත දැක්වෙන ලෙස සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 18 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"18. සමිතිය විසින් සියළුම ස්ථිර පත්කිරීම් කළ යුත්තේ එම කාර්යය සඳහා පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක නිර්දේශයන් සලකා බැලීමෙන් පසුවය. එසේ තනතුරකට පත් කිරීමට පෙර එසේ පත් කරනු ලබන පුද්ගලයාගේ සුදුසුකම් ද වෙනත් අදාළ විස්තර ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර එම පත් කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය."

(2) එහි 31 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"31. ඉල්ලා අස්වන සේවකයකුට ඔහුගේ ඉල්ලා අස්වීමට කලින් වූ සේවය සම්බන්ධයෙන් පැන නගින යම් ප්‍රතිලාභයක් ඇත්නම් එය ඔහුට හිමි විය යුතුය ;

එසේ වුවද ඒ සේවකයා පසු අවස්ථාවක දී යම් තනතුරකට නැවත පත් කිරීමට යෙදුනහොත් ඔහුගේ ඉල්ලා අස්වීමට කලින් සේවය වෙනුවෙන් එබඳු කිසිම ප්‍රතිලාභයක් ලැබීමට ඔහුට හිමිකම් නොමැත්තේය." ;

(3) එහි 32 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"32. (1) සේවකයකු වයස අවුරුදු හැටට එළඹුන විට ඔහු විශ්‍රාම යැවිය යුතුය. ඔහු විශ්‍රාම යවනු ලබන දිනය එදිනට යටත් පිරිසෙයින් මාස තුනකටවත් කලින් සේවකයාට දැනුම් දිය යුතුය. එසේ වුවද යම් හෙයකින් එසේ දැනුම් දීමට අපොහොසත් වුවහොත් එය වයස අවුරුදු හැට ඉක්මවා සේවයේ සිටීමට හේතුවක් නොවිය යුතුය ;

එසේ වුවද වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ වූ සේවකයකු සේවයෙන් විශ්‍රාම ගැනීමට කැමති අවස්ථාවක ඔහු විශ්‍රාම යාම ගැන ඔහුගේ සේවායෝජකයා එකඟ වන්නේ නම් ඒ වයසට පැමිණීමෙන් පසු සේවයෙන් විශ්‍රාම ගැනීමට ඔහුට හිමිකම් ඇත. ඔහු විශ්‍රාම යන දිනය ඒ දිනයට යටත් පිරිසෙයින් මාස තුනකටවත් කලින් තම සේවායෝජකයාට දැනුම් දිය යුතුය.



A 1—D 034536—6,060 (94/12)

(2) වයස අවුරුදු හැටට එළඹීමෙන් පසු සේවයේ රැඳී සිටීමට කිසිම සේවකයකු ට හිමිකමක් නොමැත." ;

(4) එහි 34 වන නියෝගයට ඉක්බිතිවම පහත දක්වෙන අළුත් නියෝගය ඇතුළත් කිරීමෙන් ; ඒ නියෝගය '34අ' නියෝගය වශයෙන් සංඛ්‍යා පැවැත්විය යුතුය.

"34අ. 34 වන නියෝගයේ විධිවිධාන යටතේ සේවය අතහැර ගියා සේ සලකනු ලැබූ සේවකයකු සම්බන්ධයෙන් සමිතිය විසින් ගනු ලබන තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන සේවකයකුට තමාට එම තීරණය දැනුම් දුන් දිනයේ සිට දින විසි එකක් ඇතුළත කොමිෂන් සභාවට අභියාචනයක් කරනු ලැබිය හැකිය. කොමිෂන් සභාවේ තීරණය අවසාන සහ තීරණාත්මක වන්නේය." ;

(5) එහි 79 වන නියෝගය වෙනුවට පහත දක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන් :—

"79.(1) සේවකයකුට විරුද්ධව කිසියම් සමූපකාර සමිතියක් විසින් නිකුත් කරනු ලබන විනය නියෝගයක් හේතු කොට ගෙන පැන නගින අභියාචනයක් විභාග කිරීම පිළිබඳ බලධරයා වන්නේ සමූපකාර සේවක කොමිෂන් සභාව හෝ කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවන ලද කම්කරු විනිශ්චය සභාවයි.

79.(2) කම්කරු විනිශ්චය සභාවක් වෙත කරන යම් ඉල්ලීමක් කාර්මික ආරවුල් පනතේ 31ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබිය යුතුය." ;

(6) එහි 135 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන්.—

"135. සමිතියක් විසින් එහි සේවකයකුට විරුද්ධව පවත්වනු ලබන විනයානුකූල ක්‍රියාමාර්ගයකින් පසුව කරනු ලබන නියෝගයකට විරුද්ධව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම අභියාචනයන් අදාළ සේවකයා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් කිසි වෘත්තීය සමිතියක් විසින් V වන පරිශිෂ්ටයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව ලිඛිතව පිළියෙල කර යථෝක්ත නියෝගය නිකුත් කළ දින සිට මාස හයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය. ඔහු වෙනුවෙන් වෙනත් අයකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් භාර නොගැනීමට හෝ පිළිනොගැනීමට ඉඩ ඇත. වෘත්තීය සමිතියක් විසින් ඉදිරිපත් කරනු ලබන්නා වූ සෑම අභියාචනයක් ම එම වෘත්තීය සමිතියේ ලේකම් හෝ සභාපති හෝ විසින් අත්සන් කර තිබිය යුතුය. ඒ අභියාචනයේ පිටපතක් සමිතිය වෙත අවස්ථාවෝචිත පරිදි සේවකයා හෝ වෘත්තීය සමිතිය විසින් ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. අභියාචනයේ බැලූ බැල්මට පෙනී යන අන්‍යමට තීරණය කෙරෙහි බලපෑමට ඉඩ තිබුණු අළුත් සහ අදාළ කරුණු ඇති බවටත්, එම කරුණු ඊට කලින්, දිනයක දී එළිදරව් නො කිරීමට ප්‍රමාණවත් හේතුවක් ඇති බවටත් කොමිෂන් සභාව සෑහීමකට පත් වුවහොත් යථෝක්ත අභියාචනයේ තීරණය දුන් දින සිට දින හැටක් ඇතුළත දෙවන අභියාචනයක් කිරීමට ඉඩ දිය හැකිය." ;

(7) එහි 139 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන අළුත් නියෝගය ආදේශ කිරීමෙන්.—

"139. අභියාචනා පරීක්ෂණ නිලධාරියා විසින් සිය අභිමතය පරිදි සමූපකාර සේවකයකුට හෝ පිළිගත් වෘත්තීය සමිතියකට හෝ සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ පුද්ගලයකුට සමිතිය හෝ සේවකයා හෝ නියෝජනය කිරීම සඳහා අවසර දෙනු ලැබිය හැකිය;

එසේ වුව ද අභියාචන පරීක්ෂණ නිලධරයා විසින් සමිතිය නියෝජනය කරනු ලැබීමට අවසර දෙන අවස්ථාවක දී ඔහු විසින් සේවකයාට ද තමන් නියෝජනය කරනු ලැබීමට අවසර දීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

V වන පරිශිෂ්ටය

ලිපිනය :———.
දිනය :———.

ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,

.........................................................

.........................................................

සමූපකාර සේවක කොමිෂන් සභා නියෝගවල 135 වැනි නියෝගය යටතේ ඉදිරිපත් කරන අභියාචනය

මෙහි පහත අත්සන් කරන ........................................................ වන මම, මට විරුද්ධව දෙන ලද විනය පරීක්ෂණයේ තීරණය සම්බන්ධයෙන් සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමින් එයට සහනයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කරමි.

1. සම්පූර්ණ නම :———.
2. පදිංචි ලිපිනය :———.
3. චෝදනා පත්‍රය භාරදෙන අවස්ථාවේ දී දැරූ තනතුර :———.
4. එය ස්ථිර ද තාවකාලික ද ? :———.
5. මුල් පත්වීම කළ දිනය නම් වැඩ තහනම් කළ දිනය :———.
6. පළමුවන පත්වීමේ දිනය :———.
7. උසස් වූ දිනය :———.
8. සමිතියේ නම :———.
9. දඬුවම ලැබීමට තුඩු දුන් කරුණු :———.

10. දෙන ලද දඬුවම :——.

11. ඒ සම්බන්ධව විනය පරීක්ෂණය පැවැත්වූවේ ද ? :——.

12. එසේ නම් විනය පරීක්ෂණය ආරම්භ වූ දිනය :——, අවසන් වූ දිනය :——.

13. විනය පරීක්ෂණ නිලධරයාගේ නම සහ තනතුර :——.

14. සමිතියේ තීරණය තමන්ට දැන් වූ දිනය :——.

15. අභියාචනය ඉදිරිපත් කරන්නේ කුමන හේතු මත ද ? ඒ හේතු :——.

(1) :——.

(2) :——.

(3) :——.

(4) :——.

16. ඉල්ලුම්කරු ඉල්ලන්නේ කුමන සහනයක් ද ? :——

(1) නැවත සේවය ලබා ගැනීමට ද ? :——

(2) හිඟ වැටුප් ලබාගැනීමට ද ? ——

(3) නියම කරන ලද දඩ මුදල් ඉවත් කරවා ගැනීමට ද ? ——

(4) වෙනත් යම් සහනයක් ද ? (පැහැදිලි කරන්න) :——.

ඉහත සඳහන් කරුණු නිවැරදි බව සහතික කරන අතර මෙම කරුණ සම්බන්ධයෙන් මවිසින් කාර්මික ආරවුල් පනතේ 31ආ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය සභාවක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් නොකළ බවද ඉදිරියේදීත් ඉදිරිපත් නොකරන බවද යම් අසත්‍ය කරුණක් මෙහි වේනම් මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට හේතුවක් වන බව ද දනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන :
දිනය : ..............................

සමිතියේ නාම :
පිටපත : සාමාන්‍යාධිකාරී.

අභියාචනය වෘත්තීය සමිතියක් මගින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් පහත සඳහන් කොටස වෘත්තීය සමිතිය විසින් සම්පූර්ණ කළ යුතුය.

.........................................වෘත්තීය සමිතියේ සාමාජිකයකු වන ..............................මහතා/මහත්මිය වෙනුවෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත මෙම ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබේ.

අත්සන :

ලේකම්/සභාපති.

වෘත්තීය සමිතියේ නාම :

දිනය : ..............................

13-626